(නවවැනි පාර්ලිමේන්තුව - සිව්වැනි සභාවාරය)

අංක 1(11).]

# පාර්ලිමේන්තුවේ අංක 1 දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2023 මැයි 02 අඟහරුවාදා**

**2023 මැයි 23 අඟහරුවාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1541/2023

ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ කුඩා තේ වතු ප්‍රමාණය එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් අක්කරවලින් කොපමණද;

(ii) එම කුඩා තේ වතුවලින් වාර්ෂිකව නිෂ්පාදනය කරනු ලබන තේ ප්‍රමාණය කොපමණද;

(iii) කුඩා තේ වතු හිමියන් වෙනුවෙන් ලබා දෙන සහනාධාරයේ වටිනාකම කොපමණද;

(iv) ශ්‍රී ලංකාවේ තේ නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1577/2023

ගරු සංජීව එදිරිමාන්න මහතා,— වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වනවිට ස්ථාපිත කර ඇති සීමාසහිත විවිධ සේවා සමූපකාර සමිති සංඛ්‍යාව කොපමණද;

(ii) එම සමිති යටතේ ස්ථාපිත කර ඇති සමූපකාර ග්‍රාමීය බැංකු ශාඛා සංඛ්‍යාව කොපමණද;

(iii) එම බැංකු පද්ධතියේ මේ වනවිට සිටින ගනුදෙනුකරුවන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම බැංකු පද්ධතියේ වත්කම් හා බැරකම්වල වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) සමූපකාර ග්‍රාමීය බැංකු පද්ධතිය සඳහා ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සහ කාඩ්පත් පහසුකම් තිබේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1615/2023

ගරු තිස්ස අත්තනායක මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ''පරිසර මාවත ව්‍යාපෘතිය'' යටතේ, තෝරාගත් පළාත් සඳහා පරිසර මාවත ස්ථාපිත කිරීමට පරිසර අමාත්‍යාංශය විසින් 2018 වර්ෂයේදී රුපියල් මිලියන 5ක ප්‍රතිපාදන එවකට රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත නිදහස් කර ඇති නමුත්, එම ප්‍රතිපාදනයෙන් රු.20,000/=ක් පමණක් වැය කිරීමට හේතු කවරේද;

(ii) 2021 වර්ෂයේදී පරිසර මාවත් 100ක් ස්ථාපිත කිරීමට සැලසුම් කර තිබූ නමුත් පරිසර මාවත සම්බන්ධයෙන් අර්ථ දැක්වීමක් හා නිර්ණායක හඳුන්වාදීමක් සිදු නොකිරීමට හේතු කවරේද;

(iii) පරිසර අමාත්‍යාංශයේ 2021 වර්ෂයට අදාළ කාර්ය සැලසුමේ පරිසර මාවත ව්‍යාපෘතිය අන්තර්ගත නොකිරීමට හේතු කවරේද;

(iv) පරිසර මාවත ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමකින් තොරව එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම නවතා දැමීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1636/2023

ගරු මිලාන් ජයතිලක මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව මඟින් වාර්ෂිකව ප්‍රතිලාභ ලබා ගනු ලබන සාමාජිකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ආයතනය මඟින් ප්‍රතිලාභ ලබා දෙන අනතුරු සම්බන්ධයෙන් ජනතාව දැනුම්වත් කර තිබේද;

(iii) එම ආයතනයෙන් ලබා දෙන ප්‍රතිලාභ තවදුරටත් වැඩි කිරීම සඳහා හැකියාවක් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත ආයතනය පිළිබඳව ජනතාව දැනුම්වත් කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

(ii) එම ආයතනය වඩාත් ජනතා හිතවාදී ආයතනයක් ලෙස පවත්වාගෙන යාමට වැඩපිළිවෙළක් සකස් කර තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1675/2023

ගරු වේලුස් නිර්මලනාදන් මහතා,— අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ බන්ධනාගාර ගත කර ඇති රැඳවියන් වර්ග කර ඇති ආකාරය කවරේද;

(ii) එම එක් එක් වර්ගයේ රැඳවියන් සඳහා ලබා දෙනු ලබන ආහාර ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) මේ වනවිට ශ්‍රී ලංකාවේ බන්ධනාගාරවල රඳවා තබා ගත හැකි රැඳවියන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම සංඛ්‍යාව ඉක්මවා මේ වනවිට රඳවා තබා සිටින රැඳවියන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1756/2023

ගරු සමන්ප්‍රිය හේරත් මහතා,— කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සමාජ සේවා දෙපාර්තමේන්තුව විසින් ආබාධ සහිත තැනැත්තන් වෙනුවෙන් ක්‍රියාත්මක කරනු ලබන නිවාස සංවර්ධන වැඩසටහන මේ වනවිට ක්‍රියාත්මක වන්නේද;

(ii) එසේ නම්, නිවසක් ඉදිකර ගැනීම සඳහා එක් පවුලක් සඳහා ලබා දෙනු ලබන මුදල කොපමණද;

(iii) එම වැඩසටහන යටතේ මේ දක්වා නිවාස ආධාර ලබා දී ඇති පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(iv) වර්ෂයකට නිවාස ආධාර ලබා දෙනු ලබන පවුල් සංඛ්‍යාව කොපමණද;

(v) ඉහත වැඩසටහන ඉදිරියටත් ක්‍රියාත්මක කරන්නේද;

(vi) ලබා දෙනු ලබන නිවාස ආධාර මුදල මේ වනවිට වැඩි කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1801/2023

ගරු කුමාරසිරි රත්නායක මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මොනරාගල දිස්ත්‍රික්කයේ ඇති වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම මධ්‍යස්ථානවල පවත්වාගෙන යනු ලබන පූර්ණකාලීන හා අර්ධකාලීන පාඨමාලා වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත මධ්‍යස්ථානවල මේ වනවිට පාඨමාලා හදාරනු ලබන සිසුන් සංඛ්‍යාව කොපමණද;

(iv) පාඨමාලා සාර්ථකව නිම කරනු ලබන තරුණ තරුණියන් වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන් යටතේ රැකියා සඳහා යොමු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1812/2023

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මධ්‍යම අධිවේගී මාර්ගයේ රඹුක්කන සිට ගලගෙදර දක්වා වූ කි.මී.20ක දිගින් යුතු කොටස ඉදිකිරීම සඳහා ටෙන්ඩර් කැඳවූ දිනය කවරේද;

(ii) ඒ සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද දේශීය සමාගම් සංඛ්‍යාව, එම එක් එක් සමාගමේ නම හා ඉදිරිපත් කරන ලද මිල ගණන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද විදේශීය සමාගම් සංඛ්‍යාව, එම එක් එක් සමාගමේ නම හා ඉදිරිපත් කරන ලද මිල ගණන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) මෙම ටෙන්ඩර් පටිපාටියේදී විවිධ අක්‍රමිකතා සිදු වී ඇති බවට එල්ල වන චෝදනා සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2530/2023

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— සංචාරක හා ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කින්නියා, මුතූර්, වෙරුගල්, තඹලගමුව සහ කුච්චවේලි යන එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රජයේ ඉඩම්වල පදිංචිව සිටින ඉඩම් හිමිකම් ඔප්පු නොමැති පවුල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රජයේ ඉඩම්වල පදිංචිව සිටින, හිමිකම් ඔප්පු ලබා දී ඇති පවුල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත (i) හි සඳහන් පවුල් සඳහා ඔප්පු ලබා දීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරන්නේද;

(iv) එසේ නම්, එම වැඩසටහන ක්‍රියාත්මක කරන ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2575/2023

ගරු ඩී. වීරසිංහ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වනවිට බීජ වී හිඟයක් පවතින බව දන්නේද;

(ii) එම හිඟය මගහරවා ගැනීම සඳහා මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) බීජ වී නිෂ්පාදනය කිරීම සඳහා සුදුසු ප්‍රදේශ හා ගොවීන් හඳුනාගෙන තිබේද;

(ii) එම ගොවීන් සඳහා සපයනු ලබන පහසුකම් කවරේද;

(iii) යල සහ මහ කන්න දෙක සඳහා අවශ්‍ය බීජ වී නිෂ්පාදනය කිරීමට කටයුතු කර තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2023 මැයි 24 බදාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2622/2023

ගරු නිතීඥ මධුර විතානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ යම් අක්‍රමිකතාවයක්, අයථා පත්වීමක්, දූෂණ ක්‍රියාවක් හෝ නීති විරෝධී ක්‍රියාවක් සිදු වී තිබේද;

(ii) එසේ නම්, ඒවා වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත සඳහන් එක් එක් කරුණ හේතුවෙන් රජයට අහිමි වී ඇති මූල්‍ය, දේපල හා මානව සම්පත්වල වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (i) හි සඳහන් ක්‍රියා සඳහා වගකිව යුතු නිලධාරීන් හඳුනාගැනීමට විමර්ශන සිදු කර තිබේද;

(ii) වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන ඇත්නම්, ඔවුන්ට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන නොමැති නම්, ඊට හේතු කවරේද;

(iv) ඉදිරියේදී ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගනු ලබන්නේද;

(v) ඉදිරියේදී සිදු විය හැකි මෙවැනි ක්‍රියා වැළැක්වීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2691/2023

ගරු කේ. පී. එස්. කුමාරසිරි මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කෘෂිකාර්මික කටයුතු සඳහා ගොවීන් විසින් භාවිතා කරනු ලබන කෘමිනාශක හා වල්නාශකවල මිල ඉතා අධික බවත්;

(ii) ඒවා නිසි ප්‍රමිතියකින් යුක්ත නොවන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) කෘමිනාශක හා වල්නාශක ආනයනය කිරීමේදී නියාමනයක් සිදු නොකිරීමට හේතු කවරේද;

(ii) ඒවායේ මිල පාලනය කිරීම සඳහා පියවර නොගැනීමට හේතු කවරේද;

(iii) කෘමිනාශක හා වල්නාශක භාවිතය සම්බන්ධයෙන් කෘෂි ක්ෂේත්‍ර නිලධාරීන් මාර්ගයෙන් ගොවීන් දැනුම්වත් කිරීමට පියවර ගන්නේද;

(iv) කෘෂි රසායන ද්‍රව්‍ය මෙරට තුළ නිෂ්පාදනය කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2843/2023

ගරු යූ. කේ. සුමිත් උඩුකුඹුර මහතා,— මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදල යටතේ ''ශ්‍රම සුව රැකවරණ'' සෞඛ්‍ය රක්ෂණ ක්‍රමය ක්‍රියාත්මක වන්නේද;

(ii) එම රක්ෂණ ක්‍රමයේ ප්‍රතිලාභ හිමිවන පාර්ශ්වයන් කවරේද;

(iii) එක් ප්‍රතිලාභියෙක් වෙනුවෙන් ගෙවනු ලබන ප්‍රතිලාභ ප්‍රමාණය කොපමණද;

(iv) වර්ෂ 2015 සිට මේ දක්වා ඉහත රක්ෂණ ක්‍රමය යටතේ ගෙවා ඇති ප්‍රතිලාභ මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2878/2023

ගරු යදාමිණී ගුණවර්ධන මහතා,— කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලාංකිකයන් විශාල ප්‍රමාණයක් විදේශ රැකියාවල නියුතුව සිටින අතර සාමාන්‍යයෙන් එක් පුද්ගලයෙකු නැවත අප රට වෙත ප්‍රේෂණය කරන මුදල, පසුගිය දශක දෙක තුනකට පෙර ප්‍රමාණයට වඩා, මේ වනවිට ඉහළ ගොස් ඇති බව දන්නේද;

(ii) මෙලෙස වැඩිම ශ්‍රී ලාංකික රටවිරුවන් සිටින රටවල් දහය සහ නගර දහය මොනවාද;

(iii) මෙලෙස වැඩිම ශ්‍රී ලාංකික ඒක පුද්ගල ප්‍රේෂණය සාමාන්‍ය අගයන් ඇති, රටවල් දහය සහ නගර දහය මොනවාද;

(iv) එලෙසම සමස්ත අගයක් ලෙස, වැඩිම ප්‍රේෂණ සිදුකරන රටවල් දහය සහ නගර දහය මොනවාද;

(v) ඉහත සඳහන් රටවල් හෝ නගරවල සිට මුදල් ප්‍රේෂණය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ මහ බැංකුව විසින් අනුමත යම් බැංකුවක හෝ මූල්‍ය ආයතනයක පහසුකම් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2933/2023

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා,— කම්කරු සහ විදේශ රැකියා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඕමානය හා ඩුබායි වැනි රටවලට ශ්‍රී ලාංකික කාන්තාවන් රැගෙන යාමේ මිනිස් ජාවාරමක් ක්‍රියාත්මක වන බව දන්නේද;

(ii) එම ජාවාරමට ඉහත රටවල ස්ථාපනය කර ඇති ශ්‍රී ලංකා තානාපති කාර්යාලවල සේවකයන්ද සම්බන්ධ බවට තොරතුරු අනාවරණය වී ඇති බව පිළිගන්නේද;

(iii) එසේ නම්, එම එක් එක් සේවකයාගේ නම, තනතුර හා සේවා ස්ථානය කවරේද;

(iv) එම සේවකයන්ට එරෙහිව ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(v) විදෙස්ගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් හා එම රටවල ස්ථාපිත කර ඇති ශ්‍රී ලංකා තානාපති කාර්යාලවල සේවකයන් අතර සුහදතාවය වර්ධනය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2968/2023

ගරු හේෂා විතානගේ මහතා,— ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට මේ දක්වා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ නිලවරණ පවත්වන ලද දින කවරේද;

(ii) එම එක් එක් නිලවරණයෙන් ජයග්‍රහණය කර අදාළ තනතුරුවලට පත් වූ එක් එක් පුද්ගලයාගේ නම, ලිපිනය හා තනතුරු නාමය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම පුද්ගලයන්ට ගෙවන ලද වැටුප් හා දීමනා සහ ලබා දෙන ලද ඉන්ධන හා වෙනත් පහසුකම් වෙනුවෙන් දරන ලද වියදම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම පුද්ගලයන් වෙනුවෙන් දරන ලද ඉහත වියදම්වලට සාපේක්ෂව ක්‍රිකට් ක්‍රීඩාවේ සංවර්ධනය උදෙසා ඔවුන්ගෙන් ලැබී ඇති දායකත්වය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3075/2023

ගරු අශෝක් අබේසිංහ මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ දුම්රිය මාර්ගවල මුළු දිග කොපමණද;

(ii) මුහුදු බඩ මාර්ගය, ප්‍රධාන මාර්ගය, කැලණිවැලි මාර්ගය සහ පුත්තලම මාර්ගය යන එක් එක් දුම්රිය මාර්ගයේ දිග වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත සඳහන් එක් එක් දුම්රිය මාර්ගයේ ඇති අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ග සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ග ආරක්ෂිත දුම්රිය හරස් මාර්ග බවට පත්කිරීම සඳහා මේ දක්වා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3091/2023

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ පවතින දුම්රිය ස්ථානවල නම් කවරේද;

(ii) ප්‍රශස්ත දුම්රිය සේවයක් පවත්වාගෙන යාම සඳහා දුම්රිය ස්ථානාධිපතිවරුන්ගේ සේවය අත්‍යාවශ්‍ය බව පිළිගන්නේද;

(iii) අවසන් වරට දුම්රිය ස්ථානාධිපතිවරුන් බඳවාගන්නා ලද දිනය කවරේද;

(iv) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ අනුමත දුම්රිය ස්ථානාධිපතිවරුන් සංඛ්‍යාව කොපමණද;

(v) දුම්රිය ස්ථානාධිපති තනතුරේ මේ වනවිට පවතින පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(vi) එම පුරප්පාඩු පිරවීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3104/2023

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට ගුරු සහායක පත්වීම් ලබා දී ඇති උතුරු පළාතේ කිළිනොච්චිය සහ මුලතිව් යන දිස්ත්‍රික්කවල රජයේ පාසල්වල ස්වේච්ඡා ගුරුවරුන් ලෙස සේවය කරන ලද සංඛ්‍යාව කොපමණද;

(ii) එම පත්වීම් ලබා දෙන ලද පදනම කවරේද;

(iii) එම පත්වීම් ලබා දෙන ලද දිනය කවරේද;

(iv) එම ගුරු සහායකයන් පිහිටුවා ඇති වැටුප් පරිමාණය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් ගුරු සහායකයන් ගුරු සේවයේ 3 (i) ශ්‍රේණියේ (ආ) තනතුරට පත් කරන ලද දිනය කවරේද;

(ii) ගුරු සහායක පත්වීම් ලබා දීමේදී ස්වේච්ඡා ගුරුවරුන් ලෙස 2013.07.01 දින සිට 2018.08.01 දක්වා සේවය කරන ලද කාල පරිච්ඡේදය ඔවුන්ගේ සේවා කාලයට එකතු නොකිරීමට හේතු කවරේද;

(iii) ස්වේච්ඡා ගුරු පත්වීම් ලබා දෙන දිනය, ඔවුන්ගේ ගුරු සේවයේ මුල් පත්වීම් දිනය ලෙස සැළකීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3153/2023

ගරු තවරාජා කලෙයි අරසන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අධ්‍යාපන අමාත්‍යාංශයේ තාක්ෂණික අධ්‍යාපන සංවර්ධන වැඩසටහන් අධ්‍යක්ෂවරයාගේ 2020.06.25 දිනැති ලිපිය ප්‍රකාරව කල්මුනේ අධ්‍යාපන කලාපයේ, කල්මුනේ, කමු/කමු/වෙස්ලි උසස් පාසලේ තාක්ෂණික අධ්‍යාපනය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා අවසර ලබා දී මුල්‍ය ප්‍රතිපාදනද වෙන් කර ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන ලද බවත්;

(ii) ඉහත ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා එම පාසලේ තිබූ පරිගණක කාමරය සහ පන්ති කාමර පහකින් සමන්විත ගොඩනැගිල්ල නිසි අවසරය මත කඩා ඉවත් කරන ලද බවත්;

(iii) මේ වනවිට ඉහත පාසලේ තාක්ෂණික පාඨමාලාව හැදෑරීම සඳහා නව හෝ පැරණි ගොඩනැගිල්ලක් නොමැති වීමෙන් සිසුන් දුෂ්කරතාවයට පත්ව ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මේ වනවිටත් ඉදිකිරීම් කටයුතු අවසන් කර නොමැති ඉහත ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා වෙන්කරන ලද ප්‍රතිපාදනයේ වර්තමාන තත්ත්වය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2023 මැයි 25 බ්‍රහස්පතින්දා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1/2023

ගරු චමින්ද විජේසිරි මහතා,— මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) පසුගිය "යහපාලන රජය" පැවති අවදියේ ශ්‍රී ලංකා මහ බැංකුවේ බැඳුම්කර වංචාව සිදු වන අවස්ථාවේදී ශ්‍රී ලංකා මහ බැංකුව අයත්ව තිබූ අමාත්‍යාංශය කවරේද;

(ii) එම අවස්ථාවේදී ඉහත සඳහන් අමාත්‍යාංශය භාරව සිටි අමාත්‍යවරයාගේ නම සහ අමාත්‍යාංශ ලේකම්වරයාගේ නම වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම බැඳුම්කර වංචාව සම්බන්ධයෙන් මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

386/2023

ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා,— වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවට ආවේණික, දුර්ලභ හා වඳවීයාමේ තර්ජනයට ලක් වී ඇති ශාක හා සත්ත්ව ජාන කොටස් නීති විරෝධී ලෙස විදේශ රටවලට රැගෙන යාමේ යෙදෙන විදේශිකයන් සිටින බව දන්නේද;

(ii) ඔවුන් අත්අඩංගුවට ගැනීමෙන් පසු නියම කරනු ලබන දඩ මුදල ගෙවා ඔවුන්ට පහසුවෙන්ම ශ්‍රී ලංකාවෙන් පිටවීමට අවස්ථාව ලැබී තිබේද;

(iii) ඔවුන් නැවත නැවත ශ්‍රී ලංකාවට පැමිණ එම කටයුත්තේ යෙදී තිබෙන අවස්ථාවන් වාර්තා වී තිබේද;

(iv) එම කටයුත්තේ යෙදී ඇති සංවිධානාත්මක පුද්ගලයන් හඳුනා ගැනීමට කටයුතු කර තිබේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙවැනි කටයුතු මැඩපැවැත්වීම සඳහා ප්‍රමාණවත් වනජීවී නිලධාරින් සංඛ්‍යාවක් සිටින්නේද;

(ii) නොඑසේ නම්, නිලධාරින් සංඛ්‍යාව වැඩි කරගැනීමට ක්‍රමවේදයක් තිබේද;

(iii) ශ්‍රී ලංකාවේ වනාන්තරවල සංචාරය කරනු ලබන විදේශිකයන්ගේ ක්‍රියා කලාපය නිරීක්ෂණය කිරීම සඳහා වැඩපිළිවෙළක් තිබේද;

(iv) එසේ නම්, එම වැඩපිළිවෙළ කවරේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

416/2023

ගරු ගයන්ත කරුණාතිලක මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ශ්‍රී ලංකා පොලීසිය සතු නිල සුනඛයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පොලිස් නිල සුනඛයන්ගේ වර්ග කවරේද;

(iii) එම එක් එක් වර්ගය අනුව නිල සුනඛයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පොලිස් නිල සුනඛ කොට්ඨාසයට අනුයුක්ත කර ඇති නිලධාරින් සංඛ්‍යාව;

(ii) වර්ෂ 2017 සිට 2021 දක්වා පොලිස් නිල සුනඛයන්ගේ ආධාරයෙන් අනාවරණය කරගන්නා ලද අපරාධ සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන්;

කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

431/2023

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මහාචාර්ය, ආචාර්ය, කලා නිධි, විද්‍යා කීර්ති, විද්‍යා ජෝති, දේශ බන්දු, දේශ කීර්ති, දේශමාන්‍ය, විශ්ව කීර්ති සහ දේශ ශක්ති ආදී එක් එක් නම්බු නාම/ ගෞරව නාම/පදවි පිරිනැමීමට බලය ඇති රාජ්‍ය ආයතන වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම එක් එක් නම්බු නාමය/ගෞරව නාමය/පදවිය පිරිනැමීමේදී සලකා බලනු ලබන අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත සඳහන් නම්බු නාම/ගෞරව නාම/පදවිවලට අමතරව රජය විසින් පිරිනමනු ලබන වෙනත් ගෞරව නාම/නම්බු නාම/පදවි තිබේද;

(iv) එසේ නම්, ඒවා පිරිනමනු ලබන ආයතන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නම්බු නාම/ගෞරව නාම/පදවි පිරිනමනු ලබන ශ්‍රී ලංකාවේ පෞද්ගලික ආයතන/සංවිධාන කවරේද;

(ii) එම එක් එක් ආයතනය/සංවිධානය විසින් පිරිනමනු ලබන නම්බු නාම/ගෞරව නාම/පදවි වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ආයතන/සංවිධාන නියාමනය කිරීම සඳහා රජයේ ක්‍රමවේදයක් තිබේද;

(iv) එසේ නම්, එම ක්‍රමවේදය කවරේද;

(v) ගෞරව නාම/නම්බු නාම/පදවි පිරිනැමීමෙන් පසු එම පුද්ගලයන් සම්බන්ධයෙන් පසු විපරම් කිරීමේ ක්‍රමවේදයක් තිබේද;

(vi) එසේ නම්, එම ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

690/2023

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ, කලවන්චිකුඩි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තුරෙයිනීලාවනෙයි ප්‍රදේශයේ ඇති ග්‍රාමීය රෝහල මේ වනවිට ප්‍රාදේශීය රෝහලක් ලෙස උත්ශ්‍රේණිගත කර ඇති බවත්;

(ii) ඉහත රෝහල සඳහා වෛද්‍යවරුන් දෙදෙනෙකු පත් කළ යුතු වුවත් මේ වනවිට පත් කර ඇත්තේ එක් වෛද්‍යවරයෙකු පමණක් බවත්;

(iii) එම වෛද්‍යවරයාට වෙනත් රෝහලකද රාජකාරී ආවරණය කිරීමට සිදු වී ඇති බැවින් ප්‍රදේශයේ ජනතාව පීඩාවට පත් වී ඇති බවත්;

(iv) මුල් කාලයේ දී ඉහත රෝහලේ ගිලන් රථයක් පැවතියද මේ වනවිට ගිලන්රථයක් නොමැති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ඉහත රෝහල සඳහා මේ දක්වා ස්ථිර වෛද්‍යවරයෙක් පත් නොකිරීමට හේතු කවරේද;

(ii) එම රෝහල සඳහා ගිලන් රථයක් ලබා නොදීමට හේතු කවරේද;

(iii) ඉහත රෝහල සඳහා ස්ථිර වෛද්‍යවරයෙක් පත් කිරීමට සහ ගිලන් රථයක් ලබා දීමට ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

814/2023

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා,— වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවට අවශ්‍ය බිත්තර සංඛ්‍යාව දෛනිකව හා වාර්ෂිකව;

(ii) මේ වනවිට ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරනු ලබන බිත්තර සංඛ්‍යාව, දෛනිකව, මාසිකව හා වාර්ෂිකව;

(iii) මේ වනවිට ශ්‍රී ලංකාවේ බිත්තර හිඟයක් පවතින්නේ නම්, එම හිඟය දෛනිකව හා මාසිකව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) බිත්තර නිෂ්පාදන කර්මාන්තයේ නියැලී සිටින කුඩා, මධ්‍යම හා මහා පරිමාණයේ නිෂ්පාදකයන් සංඛ්‍යාව;

(ii) දෛනිකව බිත්තර 1000කට වැඩි, 10,000කට වැඩි හා 100,000කට වැඩි යන එක් එක් කාණ්ඩය යටතේ බිත්තර නිෂ්පාදනය කරනු ලබන නිෂ්පාදකයන් සංඛ්‍යාව;

(iii) ඉහත (i)හි සඳහන් එක් එක් කාණ්ඩය යටතේ දිනකට නිෂ්පාදනය කරනු ලබන බිත්තර සංඛ්‍යාව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) බිත්තරයක් ආනයනය කිරීම සඳහා වැය වන මුදල කොපමණද;

(ii) පාරිභෝගිකයන් සඳහා එම ආනයනික බිත්තරයක් ලබා දිය හැකි මිල කොපමණද;

(iii) බිත්තර ඇතුළු ඇතැම් අත්‍යාවශ්‍ය පාරිභෝගික ද්‍රව්‍ය කූට ව්‍යාපාරිකයන් විසින් ඉහළ මිලකට විකුණන බව පිළිගන්නේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3169/2023

ගරු දයාසිරි ජයසේකර මහතා,— කම්කරු සහ විදේශ රැකියා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට විදේශ රැකියා සඳහා ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් ඉල්ලුම් කරනු ලබන රටවල් කවරේද;

(ii) එම එක් එක් රට විසින් ශ්‍රී ලංකාවට ලබා දෙන බවට දන්වා ඇති රැකියා අවස්ථා සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) විදේශ රැකියා සඳහා භාෂා සහතික අවශ්‍ය රටවල් කවරේද;

(ii) වලංගු වෘත්තීය පුහුණු සහතික අවශ්‍ය රටවල් කවරේද;

(iii) භාෂා සහතික සහ වෘත්තීය පුහුණු සහතික අවශ්‍ය නොවන රටවල් තිබේද;

(iv) එසේ නම්, එම රටවල් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) විදේශ රැකියා සඳහා ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් යොමු කිරීමට මේ වනවිට ගෙන ඇති පියවර කවරේද;

(ii) ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්ට විදේශ රැකියා සඳහා අවශ්‍ය සුදුසුකම්, කඩිනමින් සපුරාලීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3226/2023

ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2019 වර්ෂයෙන් පසු ජාතික පාසල් බවට පත් කරන ලද කළුතර දිස්ත්‍රික්කයේ පළාත් පාසල් සංඛ්‍යාව, එම එක් එක් පාසලේ නම, අයත් අධ්‍යාපන කලාපය, සිසුන් සංඛ්‍යාව, ජාතික පාසලක් බවට පත් කරන ලද දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) පළාත් පාසලක් ලෙස පැවති අවධියේ සිට දීර්ඝ කාලයක් ඉහත සඳහන් පාසල්වල සේවය කර, ස්ථාන මාරු ඉල්ලා ඇති ගුරුවරුන් සංඛ්‍යාව, එම එක් එක් ගුරුවරයා සේවය කරනු ලබන පාසල, සේවා කාලය සහ අධ්‍යාපන කලාපය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ස්ථාන මාරු ලබා දීම සඳහා කටයුතු කරන්නේද;

(iv) ඒ හේතුවෙන් ඇතිවන ගුරු පුරප්පාඩු පිරවීමට පියවර ගන්නේද;

(v) එම ස්ථානමාරු ලබා දීමේදී අදාළ පාසල, ජාතික පාසලක් බවට පත් කරන ලද දින සිට වර්ෂ තුනක සේවා කාලයක් සපුරාලිය යුතු බවට තීරණයක් ගෙන තිබේද;

(vi) එසේ නම්, ඉහත (ii) හි සඳහන් ගුරුවරුන්ට ඒ හේතුවෙන් සිදු වන අසාධාරණය මඟහරවාලීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3227/2023

ගරු නිරෝෂන් පෙරේරා මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජයේ සේවකයන් විදේශ රැකියා සඳහා යොමු කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කර තිබේද;

(ii) එසේ නම්, මේ වනවිට විදේශ රැකියා සඳහා ඉල්ලුම් කර ඇති රජයේ සේවකයන් සංඛ්‍යාව, ඒ අතරින් මේ වනවිට විදේශ රැකියා සඳහා යොමු කර ඇති රජයේ සේවකයන් සංඛ්‍යාව සහ විදේශ රැකියා සඳහා ඉදිරියේදී යොමු කිරීමට අපේක්ෂා කරනු ලබන රජයේ සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) විදේශ රැකියා සඳහා යොමු කරවනු ලබන රජයේ සේවකයන් එම රැකියා සඳහා පුහුණු කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3237/2023

ගරු වාසුදේව නානායක්කාර මහතා,— වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2021 වර්ෂයේ සිට අනියම් පදනම මත බඳවා ගන්නා ලද සේවකයන් 500 ක් පමණ මේ වනවිට සීමාසහිත ලංකා සතොස ආයතනයේ සේවය කරමින් සිටින්නේද;

(ii) ඔවුන්ට පත්වීම් ලිපි ලබා දී තිබේද;

(iii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සේවකයන්ට අදාළ සේවා කොන්දේසි කවරේද;

(ii) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන කම්කරු නීති එම සේවකයන් සම්බන්ධයෙන් උල්ලංඝනයවී තිබේද;

(iii) රජයේ සේවකයන් සම්බන්ධයෙන් වර්ෂ 2016 සිට 2019 දක්වා යහපාලන රජය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ අනුව මෙම සේවකයන්ට වැටුප් සකස් කර තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2023 මැයි 26 සිකුරාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

836/2023

ගරු නිතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා,— මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2020 දක්වා ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද වාහන සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ සඳහා වැය වූ මුළු මුදල සහ එක් එක් වර්ෂය අනුව වැය වූ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම වාහන ආනයනය කරන ලද රටවල් කවරේද;

(iv) එම වාහන ආනයනය කළ සමාගම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

851/2023

ගරු ගාමිණී වලේබොඩ මහතා,— සංචාරක හා ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව ඉඩම් බලතල පළාත් සභා වෙත පැවරිය යුතු බවට වර්තමාන රජයේ ප්‍රධානීන් ප්‍රකාශ කර ඇති බව දන්නේද;

(ii) මේ වනවිට මධ්‍යම ආණ්ඩුව සතු ඉඩම් බලතල, පළාත් සභා වෙත පැවරීම සඳහා සැලසුම් කර තිබේද;

(iii) එසේ නම්, එවැනි අවස්ථාවකදී, එක් පළාතක පදිංචිකරුවකුට වෙනත් පළාතක ඉඩමක් මිලදී ගැනීමේදී අනුගමනය කිරීමට සිදු වන නව නීති සහ රෙගුලාසි කවරේද;

(iv) එවැනි තත්ත්වයකදී සිය පළාත තුළ ඇති ඉඩම් විදේශිකයන්ට හෝ විදේශ සමාගම්වලට විකිණීමට හෝ බදු දීමට යම්කිසි පළාත් සභාවකට බලතල ලැබෙන්නේද;

(v) පළාත් සභාවකට සිය අභිමතය පරිදි එම බලතල සම්මත කර ගැනීමේ අයිතිය ලැබෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

860/2023

ගරු නිතිඥ රවුෆ් හකීම් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) වර්ෂ 2019 සිට 2022 දක්වා කාලය තුළ ශ්‍රී ලංකාවේ —

(i) රසායනාගාර පරීක්ෂණවලින් තහවුරු කරන ලද මුළු කොවිඩ්-19 රෝගීන් සංඛ්‍යාව;

(ii) තහවුරු කරන ලද මුළු කොවිඩ්-19 මරණ සංඛ්‍යාව;

(iii) එම මරණ සංඛ්‍යාව වයස, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, පදිංචි පළාත සහ දිස්ත්‍රික්කය, ජනවර්ගය සහ ආගම අනුව වෙන් වෙන් වශයෙන්;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) වර්ෂ 2019 සිට 2022 දක්වා කාලය තුළ ශ්‍රී ලංකාවේ කොවිඩ්-19 —

(i) මෘතදේහ බැහැර කිරීම සඳහා යොදාගත් ක්‍රමවේද/ ක්‍රමවේදය කවරේද;

(ii) ආදාහනය කිරීමෙන් බැහැර කරන ලද මෘතදේහ සංඛ්‍යාව කොපමණද ;

(iii) භූමදානය කිරීමෙන් බැහැර කරන ලද මෘතදේහ සංඛ්‍යාව කොපමණද;

(iv) වයස, ස්ත්‍රී පුරුෂ සමාජ භාවය, පළාත සහ දිස්ත්‍රික්කය, ජනවර්ගය සහ ආගම අනුව ආදාහනය කරන ලද සහ භූමදානය කරන ලද මෘතදේහ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම් ඒ මන්ද?

869/2023

ගරු රෝහණ බංඩාර මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා අනුරාධපුර දිස්ත්‍රික්කයේ එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් වාර්තා වී ඇති වකුගඩු රෝගීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම වකුගඩු රෝගීන් අතරින් මේ වනවිට වකුගඩු දීමනාව ලබන රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඉහත (i) සඳහන් වකුගඩු රෝගීන්ගේ සුබසාධනය සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1306/2023

ගරු කිංස් නෙල්සන් මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) "ගැමි සැරිය" වැඩසටහන යටතේ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ධාවනය කරනු ලබන බස්රථ සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් බස්රථය ධාවනය කරනු ලබන ගමන් මාර්ගය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ දුෂ්කර ගම්මානවල ජීවත්වන ජනතාවගේ ප්‍රවාහන පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1319/2023

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2016 සිට 2020 දක්වා එක් එක් වර්ෂයේ පවත්වන ලද අ.පො.ස. (උසස් පෙළ) —

(i) විභාගය සඳහා පෙනී සිටි සිසුන් සංඛ්‍යාව;

(ii) විභාගයේ ප්‍රතිඵල නිකුත් කිරීම සඳහා ගත වූ කාලය;

(iii) ප්‍රතිඵල නැවත සමීක්ෂණය කර ප්‍රතිඵල නිකුත් කිරීම සඳහා ගත වූ කාලය;

(iv) විභාගය සමත් වූ සිසුන්ට විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම් කිරීමට ලබා දෙන ලද කාලය;

(v) එම සිසුන් විශ්වවිද්‍යාල සඳහා ඇතුළත් කර ගැනීමට ගත වූ කාලය;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1324/2023

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජයේ පාසලක එක් පංතියක සිටිය යුතු උපරිම ශිෂ්‍ය සංඛ්‍යාව සම්බන්ධයෙන් වර්ෂ 2015 සිට මේ දක්වා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති චක්‍රලේඛ සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් චක්‍රලේඛය නිකුත් කරන ලද දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම එක් එක් චක්‍රලේඛය මඟින් නියම කර ඇති රජයේ පාසලක එක් පංතියක සිටිය යුතු උපරිම ශිෂ්‍ය සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) උපරිම ශිෂ්‍ය සංඛ්‍යාව 45 දක්වා වැඩිකිරීමේ තීරණයක් මෑතකදී ගෙන තිබේ නම්, ඒ සඳහා බලපාන ලද හේතු කවරේද;

(ii) අධ්‍යාපන වෘත්තීය සමිති එම තීරණයට දැඩි විරෝධය දක්වා තිබීම හේතුවෙන්, එම තීරණය නැවත සමාලෝචනය කිරීමට අමාත්‍යාංශය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1325/2023

ගරු ඉෂාක් රහුමාන් මහතා,— කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට අනුරාධපුර දිස්ත්‍රික්කයේ සමෘද්ධි සහනාධාරලාභීන් සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වනවිට එම දිස්ත්‍රික්කයේ සවිබලගන්වන ලද සමෘද්ධි සහානාධාරලාභීන් සංඛ්‍යාව කොපමණද;

(iii) සමෘද්ධි සහානාධාරය ලබා ගැනීමේ අරමුණින් ඉල්ලුම කර ඇති පවුල් විශාල සංඛ්‍යාවක් අනුරාධපුර දිස්ත්‍රික්කයේ සිටින බව දන්නේද;

(iv) එම පවුල් සඳහා සමෘද්ධි සහානාධාරය ලබා දීමට පියවර ගන්නේද;

(v) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1714/2023

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ බඩඉරිඟු අවශ්‍යතාවය හා නිෂ්පාදනය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම කාලය තුළ බඩඉරිඟු ආනයනය කර තිබේ නම්, ආනයනය කරන ලද බඩඉරිඟු ප්‍රමාණය හා ඒ සඳහා වැය කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ශ්‍රී ලංකාව බඩඉරිඟුවලින් ස්වයංපෝෂිත කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2879/2023

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට මේ දක්වා එක් එක් වර්ෂයේ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ලාභය/අලාභය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2023 වර්ෂය සඳහා එම සංස්ථාව ප්‍රසාද දීමනා ගෙවා ඇති බව දන්නේද;

(iii) ඒ සඳහා වැය කරන ලද මුදල එක් එක් සේවා ඛණ්ඩය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) මහා භාණ්ඩාගාරයේ උපදෙස් නොතකා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ පාලනාධිකාරිය විසින් ප්‍රසාද දීමනා ගෙවීම සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?